# සිංහල ඥාතීත්ව රටාවේ වත්මන් ප්‍රවණතා

ටී.වයි.ඩී. වික්‍රමනායක[1], බී.ජී.ඒ.ටී.එන්. වික්‍රමරත්න[2], එස්. සමරසේකර[3]

මිනිසාට තනිව ජීවත් විය නොහැකි නිසා විවිධ ස්වරූපයෙන් සම්බන්ධතා ගොඩනගා ගැනීම මිනිස් සමාජය ආරම්භයේ සිටම සිදුවිය. ඒ සෑම සම්බන්ධතා වර්ගයකින්ම සමාජීය සහ සංස්කෘතික වශයෙන් අපේක්ෂිත වූ කෘත්‍යයක් ඇත. ඥාතීත්වය ඒ අතර ඇති ප්‍රමුඛ සම්බන්ධතා වර්ගයකි. මෙය පුද්ගලයා සමාජගත කිරීමේ සහ සමූහගත කිරීමේ ඉතා වැදගත් මූලධර්මයකි. මානව විද්‍යාඥ ඊ.ආර්.ලීච් පුල්එළිය ග්‍රාමයේ ඥාතීත්ව රටාව පිළිබඳ පුළුල් පර්යේෂණාත්මක අධ්‍යයනයක් 1954-1956 අතර කාලයේ ශ්‍රී ලංකාවේ රැඳී සිටිමින් සිදු කළේය. ඔහු දක්වන පරිදි පුල්එළිය ගම්මානය සම්පූර්ණයෙන්ම ඥාතීත්වය මඟින් පාලනය වූ අතර ඉඩම් භුක්තිය ඥාතීත්වය මතම පදනම් විය. කුල ක්‍රමය ඉතා සක්‍රීයව පැවති එම සමාජයේ සමාජ පාලන බලවේගය වූයේ ඥාතීත්වය බව ඔහු පෙන්වා දී ඇත. විසි වැනි සියවසේ මැද භාගයේ සිදුකළ මෙම අධ්‍යයනය ඥාතීත්වය පිළිබඳ සලකා බැලීම නැවත සිදු කිරීමක් වශයෙන් අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් පුල්එළිය ගම්මානය තෝරා ගැනිණි. ඒ අනුව ලීච් සඳහන් කළ සිංහල ඥාති සම්බන්ධතා වර්තමානයේ කෙසේ පවතින්නේ ද යන්න පිළිබඳව විමර්ශනය කිරීම අධ්‍යයනයේ අරමුණු විය. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික ලිඛිත මූලාශ්‍රය ලෙස ඊ. ආර්. ලීච් රචිත "Puleliya-A Village in Ceylon" ග්‍රන්ථය යොදා ගත් අතර ප්‍රාථමික අලිඛිත මූලාශ්‍ර වශයෙන් අහඹු ලෙස ප්‍රදේශයේ පවුල් ඒකක 20 ක් යොදාගෙන ආකෘතිමය සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය මඟින් දත්ත ඒකරාශී කරනු ලැබීය. අධ්‍යයන නියැඳිය තුළ මහගෙදරක් ලෙස ක්‍රියාත්මක පවුල් ඒකක සංඛ්‍යාව 5% කි. එමෙන්ම අද වනවිට මෙම ගම්මානයේ 70% ක්ම න්‍යෂ්ටික පවුල් පවතින අතර 72% ක් ම පවතිනුයේ දීග විවාහයන්ය. පැරණි සිංහල ඥාති ක්‍රමයේ මහගෙදර සංකල්පය සහ එකී සංකල්පය වටා ගොඩනැඟුණු ක්‍රියාකාරකම් සමුදාය පුළුල් වෙනස්වීමකට බඳුන් වී ඇති බව ඒ අනුව පෙනීයයි. එදිනෙදා ජීවිතයේ පවත්වන ඥාති සබඳතා පිළිබඳව විමසීමේ දී ප්‍රධාන ස්ථානය න්‍යෂ්ටික පවුලේ සාමාජිකයන්ට හිමිවේ. මෙහිදී අවධාරණය වූ කරුණක් නම් සිංහල ඥාති ක්‍රමය කාලානුරූප වෙනස්වීම් රැසකට භාජනය වී ඇති බවය. එනම්, අන්තර්ජන්‍ය විවාහයන් බහිර්ජන්‍ය විවාහ බවට පත්වීම, ඇවැස්ස ඥාතීත්වය නොසලකා තම ස්වකැමැත්තට අනුව විවාහ වීම, විස්තෘත පවුල් ඒකක ක්‍රමයෙන් න්‍යෂ්ටික පවුල් ඒකකයන් බවට පත්වීම, වත්මන් පරම්පරාවට සාම්ප්‍රදායික ඥාති පද පිළිබඳව අවබෝධයක් නොවීම, ඇවැස්ස ඥාති ක්‍රමය නෂ්ඨ වී යාම ආදියයි. මෙසේ පුල්එළිය ගම්මානයේ අතීතයේ පැවති සාම්ප්‍රදායික සිංහල ඥාති ක්‍රමය වර්තමානය තුළ විශාල වශයෙන් වෙනස්වීම්වලට බඳුන්ව ඇත්තේ සමාජ සංස්කෘතික සහ ආර්ථික ව්‍යුහයේ වෙනස්වීමත් සමඟය. ඒ අනුව ඥාතීත්ව සිංහල ඥාතීත්ව සංකල්පයට පෙර පැවති සමාජ වටිනාකම අද වන විට වෙන්ව ව ඇති බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද : සිංහල ඥාතික්‍රමය, ඥාති සම්බන්ධතා, පුල්එළිය, සංස්කෘතිය, මහගෙදර සංකල්පය

[1 2 3] මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. thamaliwickramanayake@gmail.com